රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 379

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1987 සැප්තැම්බර් මස 25 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**බඳවාගැනීමේ පරිපාටිවලට ඇතුලත් කළයුතු**
**වෙනත් අධ්‍යාපනික සුදුසුකම්**

පහතින් දැක්වෙන අධ්‍යාපනික සුදුසුකම් අදාල බඳවාගැනීමේ පරිපාටිවල දක්වා ඇති සුදුසුකම්වලට විකල්ප අධ්‍යාපනික සුදුසුකම් වශයෙන් භාරගත යුතුයයි නිගමනය කර ඇත.

| නව අධ්‍යාපනික සුදුසුකම් | එම සුදුසුකම්වලට සමාන කළහැකි වෙනත් අධ්‍යාපනික සුදුසුකම් | වැඩි විස්තර සඳහා විමසීම් |
|---|---|---|
| I. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පිරිනමන රාජ්‍ය මූල්‍ය කළමණාකරන ඩිප්ලෝමාව. | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය - ආවසරික පරීක්ෂණය, වරලත් කළමණාකරන ගණකාධිකාරී ආයතනය (එක්සත් රාජධානිය) -වෘත්තීය I, හා සහතික කළ සහ සංස්ථායිය ගණකාධිකාරීන්ගේ සංගමය - වෘත්තීය I -පිළිබඳ සහතික. | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය යොමු අංකය: පී.400/84 |
| II. කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා හා ප්‍රලේඛන සේවා වෘත්තීය උසස් සහතික පත්‍රය. | කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යාවේදී උපාධිය. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසාන පරීක්ෂණ සහතිකය. | කැළණිය විශ්ව විද්‍යාලය-ශ්‍රී ලංකාව යොමු අංකය: වීසී/එම්.අයි.එන්. |
| III. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන කළමණාකාරීත්ව පිළිබඳ ඩිප්ලෝමා සහතිකය. | කාර්මික විද්‍යාලවලින් පිරිනමනු ලබන උසස් ජාතික වාණිජ ඩිප්ලෝමා සහතිකය. ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ විද්‍යා ඩිප්ලෝමාව. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය. යොමු අංකය: කා.අ.5/14/7 |

.....2 පිටුව

| | | |
|---|---|---|
| iv. එක්සත් රාජධානියේ පිහිටි පේෂකර්මාන්ත ආයතනයේ වෘත්තීය සුදුසුකම්. | ලන්ඩන් රාජකීය රසායන විද්‍යා ආයතනයේ වෘත්තීය සුදුසුකම්. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය. යොමු. අංකය: උඅ/4/6/13 |
| (අ) Fellowship (F.T.I.) සාමාජිකත්වය | (අ) Fellowship (F.R.I.C.) සාමාජිකත්වය | පේෂකර්මාන්ත අභ්‍යාස හා සේවා මධ්‍යස්ථානය. යොමු අංකය: ටී.එස්.සී/ඒඩී/14 |
| (ආ) Associateship (A.T.I) ආශ්‍රිත සාමාජිකත්වය | (ආ) Associateship (A.R.I.C.) ආශ්‍රිත සාමාජිකත්වය | |

02. අදාල බඳවාගැනීමේ පරිපාටි පරීක්ෂා කර බලවා මෙම නව අධ්‍යාපනික සුදුසුකම් යෝග්‍ය අවස්ථාවන්හිදී එම පරිපාටිවලට ඇතුලත් කිරීමට කටයුතු කරනු මැනවි.

03. ඔබ අමාත්‍යාංශය යටතේ ඇති සියළුම සංස්ථාවලට හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට මෙහි අඩංගු කරුණු දැනගැනීමට සලස්වන ලෙස කරුණාවෙන් ඉල්ලමි.

එම්. එන්. ජුනයිඩ්
වැඩබලන ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.